# සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි අතුරු වෛද්‍ය සේවා ඛණ්ඩ - 2 සේවා ගණයේ වාග් චිකිත්සක තනතුර (MT 5 - 2006 - ඒ) සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය.

දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2693869
Fax )

විද්‍යුත් තැපැල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
**Ministry of Health**

මගේ අංකය ) DDG(A)I/SOR/05/2011(VOL1)
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය ) 2013.01.22
திகதி )
Date )

අධ්‍යක්ෂ (පාලන) 06

<u>MT- 5 2006 (ඒ) වැටුප් පරිමාණය තියම කර ඇති වාග් චිකිත්සක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එවන ලද අංක PSC/EST/2/1/13/4/2012 හා 2013.01.16 දිනැති ලිපියේ මුල් පිටපත හා MT-5-2006(ඒ) බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත් මේ සමඟ එවමි.

2. ඉහත බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපතක් ලැමිනේට් හා බයින්ඩිං කර ඔබගේ භාරයේ සුරක්ෂිතව තබා ගත යුතුය.

වී. වික්‍රමරාජා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 01

පිටපත් : 1. අතිරේක ලේකම් (පාලන) - කරු.පිටපතක් අමුණා ඇත.
2. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - කරු.පිටපතක් අමුණා ඇත.
3. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)- සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියට ඇතුලත් කිරීම සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ පිටපතක් අමුණා ඇත.
4. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විමර්ශන) - පිටපතක් අමුණා ඇත.
5. අධ්‍යක්ෂ (පාලන) 05 - මධ්‍යම පරිපාලන ශාඛාවේ සුරක්ෂිතව තබා ගැනීම සඳහා පිටපතක් අමුණා ඇත.
6. අධ්‍යක්ෂ (විභාග) - කාර්යක්ෂමතා කඩඉම් හා අනිකුත් උසස්වීම් විභාග සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ පිටපතක් අමුණා ඇත.

(80)

...2136700

ලේකම් / செயலாளர் / Secretary } 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2369302, 011-2369305

විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail } sec-psc@sltnet.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.

මගේ අංකය / எனது இல. / My No. } PSC/EST/2/1/13/4/2012

ඔබේ අංකය / உமது இல. / Your No. } 06/C/02/2010

දිනය / திகதி / Date } 2013. 01. 16

Secretary 17 JAN 2013 Ministry of Health

භෞතික අධ්‍යක්ෂ ජනරාල් ශාඛා 18 JAN 2013 Deputy Director General (Admin)

ලේකම්

සෞඛ්‍ය අමාත්‍යාංශය

**MT-5 2006 (ඒ) වැටුප් පරිමාණය නියම කර ඇති වාග් චිකිත්සක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2012. 11. 30 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් අතුරු වෛද්‍ය සේවා - බණ්ඩ 2 සේවා ගණයේ වාග් චිකිත්සක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත මේ සමග එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවාගැනීම් පරිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ජේ.ඒ.එස්.පී. ජයසිංහ
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් -

01. ලේකම් - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - (මුල් පිටපත මේ සමඟ එවමි.)
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - (මුල් පිටපත මේ සමඟ එවමි.)

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි

අතුරු වෛද්‍ය සේවා බණ්ඩ - 2 සේවා ගණයේ වාග් චිකිත්සක තනතුර සඳහා වන

බඳවා ගැනීමේ පරිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : අදාල නොවේ. යොමු අංකය : දිනය :

1.2 අමාත්‍යාංශය : සෞඛ්‍ය යොමු අංකය : 06/C/02/2010 දිනය : 2012.11.30

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම } යොමු අංකය : DMS/C/08/45 දිනය : 2012.05.10

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය යොමු අංකය : EST-3/RECRU/04/6635 දිනය 2012.02.02

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය } යොමු අංකය : NSCC/4/13/SR-18 දිනය 2012.01.13

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය } යොමු අංකය : .PSC/EST/2/1/13/4/2012 දිනය 2012.08.30

**02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර**

2.1 පත් කිරීමේ බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : අතුරු වෛද්‍ය සේවා බණ්ඩ - 2

3.2 ශ්‍රේණි : III , II සහ I

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : තනතුරට අදාල තාක්ෂණික හා ශිල්පීය කාර්යයන් ඉටුකර දීමෙන් රෝග විනිශ්චය / ප්‍රතිකාර සඳහා වෛද්‍ය විශේෂඥවරුන්ට සහ වෛද්‍යවරුන්ට සහාය වීම.

**04. තනතුරේ ස්වභාවය :** ස්ථිර , විශ්‍රාම වැටුප් සහිත

## 05. වැටුප්

5.1 **වැටුප් කේත අංකය** : MT 5-2006 ඒ

5.2 **වැටුප් පරිමාණය** : රු.15,260 - 6 x 180 - 4 x 240 -11 x 320 - 20 x 360 - 28,020

5.3 **ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර**

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය ( රු.) |
|---|---|---|
| III | පියවර 01 | රු.15,260 |
| II | පියවර 12 | රු.17,620 |
| I | පියවර 23 | රු.21,180 |

## 06. සේවා ගණයට අයත් තනතුර /තනතුරු

6.1 **අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :**

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| වාග් චිකිත්සක | 43 | කථන ආබාධ වලින් පෙළෙන, ස්නායු රෝග වලින් පෙළෙන ආඝාතයෙන් (ස්ට්‍රෝක්) පෙළෙන රෝගීන්ට ප්‍රතිකාර කිරීමට සහාය වීම සහ තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් රාජකාරී. |

6.2 **ඒකාබද්ධ සේවා සංඛ්‍යාව** : ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III , II, හා I ශ්‍රේණි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් සේ සැලකේ .

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|
| වාග් චිකිත්සක | 43 |

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 **බඳවා ගන්නා අනුපාතය**

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 **විවෘත බඳවා ගැනීම**

7.2.1 **බඳවා ගන්නා ශ්‍රේණිය** : III ශ්‍රේණිය

7.2.2 **සුදුසුකම් :**

7.2.2.1 **අධ්‍යාපන සුදුසුකම්** : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයයකින් වාග් චිකිත්සාව පිළිබඳව උපාධියක් හෝ වාග් චිකිත්සාව පිළිබඳ වසර 02 කට නොඅඩු පූර්ණකාලීන ඩිප්ලෝමාවක් ලබා තිබීම.

7.2.2.2 **වෘත්තීය සුදුසුකම්** : අදාළ නොවේ.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4 **කායික සුදුසුකම්** : ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 **වෙනත්** : i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
ii. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
iii අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් දිනට අයදුම්කරුවන් විසින් සියළු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

7.2.3 **වයස** :

7.2.3.1 **අවම සීමාව** : අවුරුදු 21

7.2.3.2 **උපරිම සීමාව** : අවුරුදු 35

7.2.4 **බඳවා ගැනීමේ ක්‍රමය** : ලිඛිත විභාගය සමත් වූ සුදුසුකම් ලත් තැනැත්තන් අතුරින් ලිඛිත විභාගයේදී ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගනු ලැබේ.

7.2.4.1 **ලිඛිත විභාගය**

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | 100 | 40% |

සටහන: ලිඛිත විභාගයේ විස්තර - **ඇමුණුම 1**

7.2.4.1.1 **පවත්වන බලධරයා** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.2.4.2 **වෘත්තීය පරීක්ෂණය** : අදාළ නොවේ

7.2.4.3 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය ( ලකුණු ලබා දෙනු නොලැබේ.)**
**ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු** : කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීම.

7.2.4.3.1 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

7.2.4.4 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය** : අදාළ නොවේ

7.2.5 **අයදුම්පත් කැඳවීමේ ක්‍රමය** : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 **සීමිත බඳවා ගැනීම** : අදාළ නොවේ.

7.4 **කුසලතා මත බඳවා ගැනීම** : අදාළ නොවේ.

## 08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලා/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය- ඇමුණුම 02 |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය- ඇමුණුම 03 |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය- ඇමුණුම 04 |

8.2 **කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද :** වසරකට දෙවරක්

8.3 **කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :**

**1 වන කාර්යක්ෂමතා කඩඉම**
**2 වන කාර්යක්ෂමතා කඩඉම**
**3 වන කාර්යක්ෂමතා කඩඉම**

} සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

## 09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

9.1

| ශ්‍රේණිය | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

10.1 **III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.**

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වයයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

(iii) අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

(vi) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

**10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය** : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයින් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධාරියා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

**10.1.2 සුවිශේෂී කාර්ය සාධනය අනුව**

**10.1.2.1 සපුරාලිය යුතු සුදුසුකම් :**

(i) පත්වීම ස්ථිර කර තිබීම

(ii) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවා ගණයේ III ශ්‍රේණියේ වසර හයක (06) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම නියමිත දිනට උපයා ගෙන තිබීම.

(iii) අනුමත කාර්යසාධනය ඇගයීමේ පරිපාටිය අනුව පූර්වාසන්න වසර හය (06) තුළම සුවිශේෂී කාර්යසාධන පෙන්නුම් කර තිබීම.

(iv) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළදී ලබාගෙන තිබීම.

(vi) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

**10.1.2.2 උසස් කිරීමේ ක්‍රමය** : ඉහත සුදුසුකම් සපුරාලන නිලධරයන්ට පත් කිරීම් බලධරයා අනුමත කරන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය හැක. ඉන් සමත්වන්නන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම පරීක්ෂා කරනු ලැබේ. අදාළ සෙසු අවශ්‍යතාවන් ද සම්පූර්ණ කර ඇති නිලධරයන් පත් කිරීමේ දින සිට වසර හය (06) ක් සම්පූර්ණ වන දිනට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.
(අභියෝග්‍යතා පරීක්ෂණය පිළිබඳ විස්තර **ඇමුණුම -05** හි ඇත)

සටහන:

1. සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් ලබා දීමේ දි පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 60% ක් ලබාගත යුතුය. තවද, සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණය වර්ෂයකට එක් වරක් පවත්වනු ලබන අතර, නිලධරයකුට පෙනී සිටිය හැක්කේ එක් වතාවක් පමණි.

2. නිලධරයකුට පාලනය කළ නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හිදී පසුව පැවැත්වෙන අභියෝගාත්මක පරීක්ෂණයට එම නිලධරයාට පෙනී සිටිය හැක. එවැනි නිලධරයකු සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය සමත් වූ දිනය වේ.

## 10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

### 10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

#### 10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

(i) සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

(ii) අනුමත කාර්යසාධනය ඇගයීමේ පර්පාටිය අනුව උසස්කිරීමේ දිනට පෙරතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(iii) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

(iv) උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

#### 10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය

: සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

### 10.2.2 සුවිශේෂී කාර්ය සාධනය අනුව

#### 10.2.2.1 සපුරාලිය යුතු සුදුසුකම් :

(i) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවා ගණයේ II ශ්‍රේණියේ වසර නවය (09) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක නවය (09) ම නියමිත දිනට උපයා ගෙන තිබීම.

(ii) අනුමත කාර්යසාධන ඇගයීම් පර්පාටිය අනුව පූර්වාසන්න වසර නවය (09) තුළම සුවිශේෂී කාර්යසාධන මට්ටමක් පෙන්නුම් කර තිබීම.

(iii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

සංලක්ෂය :

1. සුවිශේෂී කාර්යසාධනය ඇගැයීමේ ක්‍රම විද්‍යක් රජය විසින් හඳුන්වා දී ක්‍රියාත්මක කරන තෙක් දැනට ක්‍රියාත්මක වන වාර්ෂික කාර්යසාධන ඇගැයීමේ දී සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරනු ලැබ ඇති තැනැත්තන්ට සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම් සඳහා වන ලිඛිත අභියෝගතා පරීක්ෂණය/ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

2. සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරින්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

10.2.2.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් සඳහා පත්කිරීම් බලධරයා විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් 50% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා නිලධරයන් II ශ්‍රේණියට උසස් වී වසර නවය (09)ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. (ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර ඇමුණුම -06 හි ඇත)

10.3 **I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම** : අදාළ නොවේ

## 11. **තනතුරුවලට පත් කිරීම**: අදාළ නොවේ

## 12. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරබාහිර වන්නා වූ කොන්දේසි :**

I. මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියළුම පත්කිරීම් / බඳවා ගැනීම් මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධායන්ට තරයේ අනුකූල වන පරිදි පමණක් විය යුතු ය.

II. බඳවා ගැනීම, සේවයේ යෙදවීම, විනය හා අනෙකුත් ආයතනික කටයුතු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ කොන්දේසි/ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 කාණ්ඩයේ විධිවිධාන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන විධිවිධාන අදාළ වේ.

III. ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකෙරෙන බැවින් මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යභාරයක් ඕනෑම ශ්‍රේණියක නිලධාරියෙකුට පැවරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය ඇත.

## 13. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :**

**"සක්‍රිය සේවා කාලය"** යනුවෙන් අදහස් කරනුයේ ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාර්යෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. **සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම:** අදාළ විස්තර ඇමුණුම 07 ඇත.

15. **මෙම බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.**

සකස් කළේ: අත්සන : (signature)
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එම්.ඒ.ආර්.පී.අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ(පාලන) 06
දිනය : 2012/11/29
නිර්දේශ කර ඉදිරිපත් කරමි.

පරීක්ෂා කළේ: අත්සන : (signature)
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2012.11.29

අත්සන : Y.S.N. Jayathilaka
(දෙපාර්තමේන්තු ප්‍රධානියා )
නම : වැ. බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
තනතුර : සෞඛ්‍ය අමාත්‍යාංශය
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
385, "සුවසිරිපාය"
නිල මුද්‍රාව : කොළඹ 10.

දිනය : 2012/11/30

යොමු අංකය : 06/C/02/2010

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි වාග් චිකිත්සක තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම සඳහා නිර්දේශ කරමි.

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අත්සන : Y.S.N. Jayathilaka
නම : වෛද්‍ය වයි.ඩී.නිහාල් ජයතිලක
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

දිනය : 2012/11/30
නිල මුද්‍රාව : ..........

යොමු අංකය : PSC/EST/2/1/13/4/2012

සෞඛ්‍ය අමාත්‍යාංශයේ හි ආයුර්වේද වෛද්‍ය සේවා ශ්‍රේණිය - II සේවා ගණය සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2012 - 09 - 30 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : (signature)
නම : ..........
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2013 01 - 15
නිල මුද්‍රාව : ..........

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

## ඇමුණුම - 01

### සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි
### අතුරු වෛද්‍ය සේවා බණ්ඩ - 2 සේවා ගණයේ වාග් චිකිත්සක තනතුර සඳහා
### වන බඳවා ගැනීම් පරිපාටිය

01. **විභාගයේ නම** : බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01යි | 100 | 40% |
| 2.සාමාන්‍ය දැනීම | පැය 01යි | 100 | 40% |

03. **විභාගය පවත්වනු ලබන බලධරයා** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග** : තනතුරු වල පුරප්පාඩු ඇති වීම මත අවශ්‍යතාවය පරිදි

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය** :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයෝ දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහි ලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| 2. සාමාන්‍ය දැනීම | වාග් චිකිත්සක තනතුරට අදාළව තර්කානුකූල කරුණු දැක්වීම සහ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම. |

සකස් කළේ :
අත්සන : ........................
නම : එම්.ඒ.ආර්.පී.අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ(පාලන)06
දිනය : 2012/11/29

පරීක්ෂා කළේ :
අත්සන : ........................
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I
දිනය : 2012.11.29

අත්සන : Y.S.N. Jayathilaka
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ........ (stamp) අ. ව. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
තනතුර : ........ සෞඛ්‍ය අමාත්‍යාංශය
දිනය : 2012/11/30 ........ ශ්‍රී.මු.ද. ජයවර්ධනපුර හිමි මාවත, 385, "සුවසිරිපාය" කොළඹ 10.
නිලමුද්‍රාව : ........................

## ඇමුණුම -02

### සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි
### අතුරු වෛද්‍ය සේවා බණ්ඩ - 2 සේවා ගණයේ වාග් චිකිත්සක තනතුර සඳහා
### වන බඳවා ගැනීම් පරිපාටිය

01. **විභාගයේ නම** : පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.කාර්යාල ක්‍රම | පැය 02යි | 100 | 40 % |
| 2.මුදල් රෙගුලාසි | පැය 02යි | 100 | 40 % |
| 3.දෙපාර්තමේන්තු රෙගුලාසි | පැය 01 1/2යි | 100 | 40 % |

03. **විභාගය පවත්වනු ලබන බලධරයා** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග** : වසරකට දෙවරක්

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය** :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. කාර්යාල ක්‍රම | **ආයතන සංග්‍රහයේ**<br>1 වන පරිච්ඡේදය - සාමාන්‍ය<br>11 වන පරිච්ඡේදය - සේවයට බඳවා ගැනීමේ කාර්ය පරිපාටි සහ පත් කිරීම්<br>111 වන පරිච්ඡේදය - මාරු කිරීම්<br>V වන පරිච්ඡේදය - මුදා හැරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම හා සේවය අවසන් කිරීම<br>VI වන පරිච්ඡේදය - සේවා ලේඛන, වාර්තා සහ සහතික<br>VII වන පරිච්ඡේදය - වැටුප්<br>VIII වන පරිච්ඡේදය - අතිකාල දීමනා, නිවාඩු දවස් හා නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා<br>X11 වන පරිච්ඡේදය - නිවාඩු<br>XXV111 වන පරිච්ඡේදය - පරිපාලන කාර්ය පරිපාටි සහ විධි<br>XXX වන පරිච්ඡේදය - රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල<br>XXX111 වන පරිච්ඡේදය - නීති උපදෙස් හා නීති ක්‍රියාමාර්ග<br>XLV11 වන පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම සහ විනය<br>XLV111 වන පරිච්ඡේදය - විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති |

| | |
|---|---|
| | * අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද කර්ය පටිපාටික රීති සංග්‍රහයේ අඩංගු :-<br>III වැනි පරිච්ඡේදය - පත් කිරීම්<br>V වැනි පරිච්ඡේදය - රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තන්<br>VI වැනි පරිච්ඡේදය - පත් කිරීම් කෙරෙහි බලපාන නියමයන්, කොන්දේසි<br>VII වැනි පරිච්ඡේදය - පත් කිරීම් වලදී අනුගමනය කළ යුතු පරිපාටිය<br>VIII වැනි පරිච්ඡේදය - පරිවාස කාලය, වැඩ බැලීමේ කාලය හා පත්වීම ස්ථිර කිරීම<br>XIV වැනි පරිච්ඡේදය - පත්වීම අවසන් කිරීම හා රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම<br>XV වැනි පරිච්ඡේදය - තනතුර අතහැර යාම |
| 2. මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි සංග්‍රහයේ<br>I පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු.<br>II පරිච්ඡේදය - වියදම්, අත්හැර දැමීම්, ආපසු ගෙවීම් ආදිය සඳහා අධිකාර බලය.<br>III පරිච්ඡේදය - මුදල් පාලනය හා ගිණුම් ගත කළ හැකි වීම.<br>IV පරිච්ඡේදය - ලැබීම්.<br>V පරිච්ඡේදය - ගෙවීම්.<br>VI පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල යනාදියේ භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්.<br><br>* රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය. |
| 3. දෙපාර්තමේන්තු රෙගුලාසි | රෝහල් පාලනයට අදාළ කරුණු හා විෂයානුබද්ධ කරුණු |

සකස් කළේ :
අත්සන : ..........
නම : එම්.ඒ.ආර්.පී.අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ(පාලන)06
දිනය : 2012/11/29

පරීක්ෂා කළේ :
අත්සන : ..........
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I
දිනය : 2012.11.29

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ..........
තනතුර : වෛ. ඛ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2012/11/30
නිලමුද්‍රාව : සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

## ඇමුණුම -03

### සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි
### අතුරු වෛද්‍ය සේවා බණ්ඩ - 2 සේවා ගණයේ වාග් චිකිත්සක තනතුර සඳහා
### වන බඳවා ගැනීම් පරිපාටිය

01. **විභාගයේ නම** : දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. විෂයය බද්ධ කරුණු | පැය 02යි | 100 | 40 % |

03. **විභාගය පවත්වනු ලබන බලධරයා** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග** : වසරකට දෙවරක්

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.විෂයය බද්ධ කරුණු | වාග් චිකිත්සාව සම්බන්ධව නිලධාරියාගේ රාජකාරි කටයුතු පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්න පත්‍රයකි. |

සකස් කළේ :
අත්සන : ..........................................
නම : එම්.ඒ.ආර්.පී.අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ(පාලන)06
දිනය : 2012/11/29

පරීක්ෂා කළේ :
අත්සන : ..........................................
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I
දිනය : 2012.11.29

අත්සන : ..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ..........................................
තනතුර : ..........................................
දිනය : 2012/11/
නිලමුද්‍රාව : ..........................................

වෛ. ඩී. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
පිහිට, "සුවසිරිපාය"
කොළඹ 10.

**ඇමුණුම -04**

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි

## අතුරු වෛද්‍ය සේවා බණ්ඩ - 2 සේවා ගණයේ වාග් චිකිත්සක තනතුර සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය

01. **විභාගයේ නම** : තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. කාර්ය විශේෂිත දැනුම | පැය 02 යි | 100 | 40 % |

03. **විභාගය පවත්වනු ලබන බලධරයා** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :** වසරකට දෙවරක්

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. කාර්ය විශේෂිත දැනුම | පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන් හි විෂය නිර්දේශයන්ට ඇතුළත් කරුණු පිළිබඳ නිලධාරියාගේ දැනුම කුසලතාවන්, ඔහුගේ ජ්‍යෙෂ්ඨතාවට සරිලන පරිදි වැඩි දියුණු වී තිබේ ද යන්න හා ගත වූ කාලය තුළ එකී ක්ෂේත්‍රයන්හි සිදු වී ඇති නවීකරණයන් පිළිබඳ දැනුවත් වී තිබීම පිළිබඳ මැන බැලීම සඳහා වන පරීක්ෂණයකි. |

| | |
|---|---|
| සකස් කළේ : | පරීක්ෂා කළේ : |
| අත්සන : [signature] | අත්සන : [signature] |
| නම : එම්.ඒ.ආර්.පී.අභයගුණවර්ධන | නම : වී.වික්‍රමරාජා |
| තනතුර : අධ්‍යක්ෂ(පාලන)06 | තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I |
| දිනය : 2012/11/29 | දිනය : 2012.11.29 |

අත්සන : [signature]
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ............

තනතුර : වෛ. බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2012/11/30

නිලමුද්‍රාව : සෞඛ්‍ය අමාත්‍යාංශය, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, 385, "සුවසිරිපාය"

නිලමුද්‍රාව : කොළඹ 10.

## ඇමුණුම - 05

### සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි

### අතුරු වෛද්‍ය සේවා ඛණ්ඩ - 2 සේවා ගණයේ වාග් චිකිත්සක තනතුර සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය

01. **විභාගයේ නම** : සුවිශේෂී කාර්යය සාධනය යටතේ III වැනි ශ්‍රේණියේ සිට II වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන අභියෝගතා පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. අභියෝගතා පරීක්ෂණය | පැය 01 1/2යි | 100 | 60 % |

03. **විභාගය පවත්වනු ලබන බලධරයා :** සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :** වසරකට එක්වරක්

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.අභියෝගතා පරීක්ෂණය | තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්යක්ෂමතා මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කරගෙන තිබේ ද යන්න හා ඒවා භාවිතයේ දී ඉහළ ප්‍රවීණතාවයක් දක්වන්නේ ද යන්න මැන බැලීමේ අභියෝගතා පරීක්ෂණයකි. |

සකස් කළේ :
අත්සන : ..........
නම : එම්.ඒ.ආර්.පී.අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ(පාලන)06
දිනය : 2012/12/17

පරීක්ෂා කළේ :
අත්සන : ..........
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I
දිනය : 2012/12/18

වී. වික්‍රමරාජා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන I) (වැ.බ.)
සෞඛ්‍ය අමාත්‍යාංශය
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ..........
තනතුර : වෛද්‍ය පී. ජී. මහීපාල
දිනය : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
නිලමුද්‍රාව : සෞඛ්‍ය අමාත්‍යාංශය, 385, "සුවසිරිපාය", පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

## ඇමුණුම - 06

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි

අතුරු වෛද්‍ය සේවා බණ්ඩ - 2 සේවා ගණයේ වාග් චිකිත්සක තනතුර සඳහා

වන බඳවා ගැනීම් පටිපාටිය

01. **පරීක්ෂණයේ නම** : සුවිශේෂී කාර්යය සාධනය යටතේ II වැනි ශ්‍රේණියේ සිට I වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

02. **සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්** :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. රාජකාරී කටයුතු වලදී ආයතනයට දක්වන ලද විශේෂ දායකත්වයන් (එක් දායකත්වයක් සඳහා ලකුණු 05 බැගින්) | 50 | 50% |
| 2. කාර්යසාධනය ඇගයීම (උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 සඳහා)<br>ඉතා හොඳයි - ලකුණු 09<br>හොඳයි - ලකුණු 06<br>සතුටුදායකයි - ලකුණු 03 | 45 | |
| 3. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 05 | |
| | 100 | |

03. **සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. **සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග** : වසරකට එක්වරක්

සකස් කළේ :
අත්සන : ..........
නම : එම්.ඒ.ආර්.පී.අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ(පාලන)06
දිනය : 2012/12/17

පරීක්ෂා කළේ :
අත්සන : ..........
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I
දිනය : 2012.12.18

වී. වික්‍රමරාජා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන I) (වැ.බ.)
සෞඛ්‍ය අමාත්‍යාංශය
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ..........
තනතුර : ..........
දිනය : ..........
නිලමුද්‍රාව : ..........

වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය,
385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

## ඇමුණුම - 07

### සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි

### අතුරු වෛද්‍ය සේවා ඛණ්ඩ - 2 සේවා ගණයේ වාග් චිකිත්සක තනතුර සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය

**බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම.**

නව බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:06/2006 (IV) මගින් ලබා දී ඇති MT 5 - 2006 "ඒ" වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන වාග් චිකිත්සක නිලධාරීන් සියළු දෙනාම නව බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ලබා සිටින MT 5 - 2006 ඒ වැටුප් පරිමාණයේ අදාළ ශ්‍රේණිය පදනම් කොට ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ වැටුප් පරිවර්තන ක්‍රමවේදය අනුව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වුව ද, අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස් ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරකට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

(i) MT 5 - III ශ්‍රේණිය

(අ) MT 5 - 2006 ඒ වැටුප් පරිමාණයෙ හි III ශ්‍රේණියට අදාළ වැටුප් ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධාරීන්.

(ආ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුව ද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්.

MT 5 - III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ii) MT 5 - II ශ්‍රේණිය

(අ) MT 5- 2006 ඒ වැටුප් පරිමාණයෙ හි III ශ්‍රේණියට අදාළ වැටුප් ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 20 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන් ම අවම වශයෙන් වැටුප් වර්ධක 10 ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්.

(ආ) MT 5 - 2006 ඒ වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධාරීන්

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 10 ක් සම්පූර්ණ වුව ද නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව I ශ්‍රේණියට උසස්වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්

MT 5 - II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

| සකස් කළේ : | | පරීක්ෂා කළේ : | |
|---|---|---|---|
| අත්සන | : [signature] | අත්සන | : [signature] |
| නම | : එම්.ඒ.ආර්.පී.අභයගුණවර්ධන | නම | : වී.වික්‍රමරාජා |
| තනතුර | : අධ්‍යක්ෂ(පාලන)06 | තනතුර | : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I |
| දිනය | : 2012/11/29 | දිනය | : 2012/11/29 |

අත්සන : Y.D.N. Jayathilaka

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :

තනතුර : වෛ. බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සෞඛ්‍ය අමාත්‍යාංශය

දිනය : 2012/11/30 දොස් බද්දේගම විමලවංශ හිමි මාවත, 385, "සුවසිරිපාය"

නිලමුද්‍රාව : කොළඹ 10.

රකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk


DDG (A) I

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
**No. 177, Nawala Road, Narahenpita, Colombo 05.**


මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/2/1/134/2012
ඔබේ අංකය / உமது இல. / Your No.: 06/C/02/2010
දිනය / திகதி / Date: 2012.09. 04

11 SEP 2012
07 SEP 2012 Deputy Director General (Admin.)
05 SEP 2012

ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

**MT 05 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියම කර ඇති වාග් චිකිත්සක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2012.05.25 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපිය මගින් ඉදිරිපත් කරන ලද අතුරු වෛද්‍ය සේවා බණ්ඩ - 2 නිලධර ගණයේ වාග් චිකිත්සක තනතුර සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය මේ සමඟ ඇති ඇමුණුමේ සඳහන් සංශෝධනයන්ට යටත්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2012.08.30 වන දින අනුමත කර ඇති අතර, එම සංශෝධන අනුව සකස් කල ඉහත බඳවා ගැනීම් පටිපාටියේ මුල් පිටපත් 04ක් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අත්සන සඳහා ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි.

(ප්‍රථමයෙන්, සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටියේ (MS Words) මෘදු පිටපතක් est4psc@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන ලෙසද, එවිට අවශ්‍ය සංස්කරණයන් සලකුණු කර නැවත ඔබ වෙත විද්‍යුත් තැපැල මගින් යොමු කළ හැකි බවද වැඩිදුරටත් දන්වමි.)

ජේ. ඒ. එස්. පී. ජයසිංහ
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් : 1) ලේකම් - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
2) ආයතන අධ්‍යක්ෂ ජනරාල්
3) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව